**ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, එම මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**----------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**--------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

1.6.1 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ මාර්ගෝපදේශ නියමයන්ගෙන් බැහැරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ ACA 2(ii) සටහන අතර අයිතම 3 ක එකතුව රු.41,272,244 ක වෙනසක් පැවතුණි. | මීට පෙර මෙම දෙපාර්තමේන්තුව විසින් සකස් කළ මූල්‍ය ප්‍රකාශනවල ද ප්‍රාග්ධන ව්‍යාපෘති අවසානයේ සටහන් කළ බැවින් සහ වාර්ෂික ඇස්තමේන්තුවේ හා භාණ්ඩාගාර අවසන් මුද්‍රිතවලද ප්‍රාග්ධන ව්‍යාපෘති අවසානයට සටහන් කර ඇති බැවින් ACA 2(II) ආකෘතියෙහි ප්‍රාග්ධන ව්‍යාපෘතිවල වියදම් වෙනත් මූලධන වියදම් යටතේ අවසානයේදී සටහන් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒසීඒ - 6 හි මූල්‍ය නොවන වත්කම්වල ආකෘතිය අනුව 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන උපකරණ ශේෂය රු. 1,192,187,538 ක් වුවද ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව එය රු.1,311,168,699 ක් වීමෙන් රු. 118,981,161 ක වෙනසක් පැවතුණි. තවද වාහන 146 කට අදාළව වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රවාහන උපකරණ බොහෝමයක් අදාළ උප ඒකක විසින් වටිනාකම ගණකාධිකාරි (වත්කම් කළමනාකරණ) ගේ ඉල්ලීමක් අනුව ඉංජිනේරු අංශය සම්බන්ධ කර ගැනීමෙන් එම සියලු වාහන 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර ඇති අතර එම වාහන වල තක්සේරු වටිනාකම් ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | ඒසීඒ - 6 හි මූල්‍ය නොවන වත්කම්වල 2020 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි හා නොනිමි වැඩ සඳහා රු. 6,488,833,907 ක ශේෂයක් දක්වා තිබුණද ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව එය රු. 1,840,747.836 ක් විය. ඒ අනුව රු.4,648,086,071 ක වෙනසක් පැවතුණි. තවද ගොඩනැගිලි 201 ක් තක්සේරු කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණද ඒවා තක්සේරු කර නොතිබුණ අතර ගොඩනැගිලි 1351 කට අදාළව වටිනාකම් හඳුනා ගැනීම සඳහා තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කටයුතු අවසන් කර එවා ඇති සියලු ගොඩනැගිලිවල වටිනාකම් ගිණුම්ගත කර ඇති බව, වාර්ෂිකව 2104 වැය විෂය යටතේ දරන ලද සියලු වියදම් ගොඩනැගිලි හා කෙරීගෙන යන වැඩ වශයෙන් ගිණුම්ගත වන අතර වත්කම් ලේඛනයෙහි ගොඩනැගිලි වල තක්සේරු වටිනාකම් පමණක් දක්වා ඇති බව, මේ හේතුවෙන් වත්කම් ලේඛනයෙහි ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් වාර්තා වී ඇති බව සහ තක්සේරු වටිනාකම ලද පසු ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම් තක්සේරුකර වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ඒසීඒ - 6 හි මූල්‍ය නොවන වත්කම්වල 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් සඳහා රු. 15,901,284,779 ක ශේෂයක් දක්වා තිබුණද එම ඉඩම්වල වටිනාකම සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. තවද ඉඩම් ඒකක 536 කට අදාළව වටිනාකම් ඉදිරිපත් කර නොතිබුණ අතර ඉඩම් ඒකක 103 කට අදාළව භූමි ප්‍රමාණයද හඳුනාගෙන නොතිබුණි. | ඉඩම්වල වටිනාකම් සඳහන් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව, එසේම භූමි ප්‍රමාණය නිශ්චිතව නොදන්නා ඉඩම්, ඒවායේ තක්සේරු කටයුතු සිදුවෙමින් පවතින බැවින් එහිදී මැනුම් කටයුතු සිදුවන නිසා ඉදිරියේදී ඒවා නිශ්චිතව හඳුනාගෙන වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | දෙපාර්තමේන්තුව සතු වත්කම් හඳුනාගැනීම හා ඒවායෙහි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඈ) ඒසීඒ - 6 හි මූල්‍ය නොවන වත්කම්වල 2020 දෙසැම්බර් 31 දිනට වෙනත් යන්ත්‍ර හා උපකරණ (ලී බඩු ඇතුළත්ව) සඳහා රු. 943,141,567 ක ශේෂයක් දක්වා තිබුණි. එහෙත් ඉදිරිපත් වූ තොරතුරුවලට අනුව පරිත්‍යාග ලෙස ලැබී තිබූ ලී බඩු සඳහා රු. 627,054,283 ක ද, යන්ත්‍ර හා උපකරණ සඳහා රු. 1,623,627,029 ක ද ස්ටර්ලින් පවුම් 120 ක ද, ජපන් යෙන් 163,985 ක ද හා ඇමරිකන් ඩොලර් 7,532,915 ක ද එම වටිනාකම් හඳුනාගෙන නොතිබුණි. | පරිත්‍යාග වශයෙන් ලද වත්කම් විශාල වශයෙන් පවතින අතර ඒවායේ තොරතුරු ලබා ගෙන ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇති බව. | වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ - පී) භාණ්ඩාගාර ගිණුම් තොරතුරු අනුව ඉදිරිපත් කළ යුතු වුවද භාණ්ඩාගාර මුද්‍රිත SA – 70 හා මූල්‍ය ප්‍රකාශන ඒසීඒ 3 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට පියවිය යුතු රු. 53,812,759 ක මුදල 2020 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් තුළ හා මුදල් පොත මඟින් පියවීම් කළ මාර්ගස්ථ මුදල් ශේෂය මූල්‍ය වත්කම් තුළ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට මුදල් පොත තුලනය කර ඉතිරි ශේෂය භාණ්ඩාගාරයට යවා පොත් වසා ඇති බවත් අග්‍රිම ගිණුමේ අවසන් ශේෂයක් නොමැති බැවින්, එය කිසිදු විටෙක මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි (ACA-P) ජංගම වගකීමක් ලෙස හෝ මූල්‍ය වත්කමක් ලෙස පෙන්වීමේ හැකියාවක් නොමැති බව. | භාණ්ඩාගාර පොත් අනුව මෙය මාර්ගස්ථ මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම රු.5,622,314,992 ක් වුවද රු.4,729,330,732 ක් ලෙස දැක්වීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ ගලායාම් රු.892,984,260 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මින් ඉදිරියට ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමට සටහන් කර ගත් බව. | මෙහෙයුම් ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ සහනාධාර හා මාරු කිරීම් වියදම රු. 101,889,711 ක් වුවද රු.43,993,255 ක් ලෙස දැක්වීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ ගලායාම් රු.57,896,456 කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ (ඒසිඒ-සී) මගින් ඉදිරිපත් කර තිබූ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලට ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීමේ වියදම රු.83,208,794 ක් වුවද එය රු. 1,034,089,513 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.950,880,719 කින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | ආයෝජන ක්‍රියාකාරකම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.4 වාණිජ අත්තිකාරම් ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික තොග තක්සේරු වාර්තාව අනුව වර්ෂය අවසානය වන විට කඳපොල බීජ අර්තාපල් ගොවිපළේ පැවති රු.1,760,000 ක් වටිනා කාබනික පොහොර තොගය ගිණුම්වලින් අත් හැරී තිබුණි. | විගණනයේ පෙන්වා දීම අනුව මුදල් රෙගුලාසි 515 ප්‍රකාරව 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | තොග වටිනාකම් හදුනාගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| (ආ) | හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය හා බිබිල උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සතුව පැවති වැඩෙන වගාවන්ගේ එකතු වටිනාකම රු.1,593,089 ක් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අවසන් තොගයට ඇතුළත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 515 ප්‍රකාරව 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | තොග වටිනාකම් හදුනාගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගොවිපළ 08 කට අදාළ පොහොර කිලෝ ග්‍රෑම් 78113 ක්, ගොවිපළ 02 කට අදාළ බීජ හා රෝපණ ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 143 ක් හා ගොවිපළ 02 කට අදාළ පාරිභෝගික බීජ වී කිලෝ ග්‍රෑම් 20191 ක වටිනාකම් හදුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | විගණනයේ පෙන්වා දීමට අනුව මුදල් රෙගුලාසි 515 ප්‍රකාරව 2021 වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේ දී අදාළ පොහොර තොගයේ පිරිවැය ගණනය කොට ගිණුම්වලට ඇතුළත් කර නිවැරදි කිරීමට සටහන් තබා ගත් බව. | තොග වටිනාකම් හදුනාගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඈ) | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල වලට අයත් ගොඩනැගිලි අතර සෘජුවම අත්තිකාරම් කටයුත්තට දායක වන ගබඩා, ශීතාගාර, බීජ සැකසුම් ඒකක යනාදි එකතු වටිනාකම රු.48,012,125 ක් වූ ගොඩනැගිලි පැවතියද ඊට අදාළ ගොඩනැගිලිවල වටිනාකම වත්කම් ලේඛනවලට නොගැනීම හේතුවෙන් වත්කම්වල වටිනාකම හා එම වත්කම්වලට අදාළ වර්ෂයේ ක්ෂය රු. 960,242 ක් ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තු නිලධාරීන්, රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් සමඟ රැස්වීම් වට කීපයක් පවත්වා අත්තිකාරම් ගිණුමට අදාළ සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කොට ක්ෂය කිරීම සඳහා යොදාගත යුතු බවට තීරණය කළ බවත් එම තීරණය අනුව පසුගිය වර්ෂය තුළ දී වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකරගෙන ගිය අතර එම වර්ෂය | අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළ වත්කම් නිවැරදිව හදුනාගෙන අනුගමනය කරන ක්ෂය ප්‍රතිපත්තිය මත ක්ෂය කර අදාළ ගැලපීම් සිදුකළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| | | තුළ දී ඇති වූ කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය මත නවතා දැමීමට සිදු වූ බවත් සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කර අත්තිකාරම් ගිණුමට අදාළ සියළු වත්කම් ක්ෂය කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇති බව. | |
| (ඉ) | ගොවිපළ 10 කට අදාළ මෝටර් රථ 21 ක්, ගොවිපළ 13 කට අදාළ යන්ත්‍රෝපකරණ අයිතම 102 ක්, ගොවිපළ 08 කට අදාළ ට්‍රැක්ටර් හා ට්‍රේලර් 29 ක් හා ගොවිපළ 3 කට අදාළ ගොඩනැගිලි අයිතම 18 ක වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කොට අත්තිකාරම් ගිණුමට අදාළ සියළු වත්කම් ක්ෂය කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | වත්කම්වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඊ) | ගොවිපළ 2 කට අදාළ එකතුව රු.716,928 ක යන්ත්‍ර වටිනාකම, අඹතැන්න ගොවිපළෙහි සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති රු. 804,111 ක් වටිනා කාර්යාල උපකරණ හා රු. 808,950 ක් වූ ට්‍රැක්ටර් හා ට්‍රේලරයේ වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කොට අත්තිකාරම් ගිණුමට අදාළ සියළු වත්කම් ක්ෂය කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | වත්කම්වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ මෙම අත්තිකාරම් කටයුත්තට අයත් ආයතන 13 කට අදාළ වටිනාකම රු.13,770,915 ක් වූ පශුධන සම්පත් පවතින බව සමීක්ෂණ වාර්තා අනුව නිරීක්ෂණය වුවද මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි. | පශුධන සම්පත් ජීව විද්‍යාත්මක සම්පතක් වන අතර මෙයට අදාළ පිළිගත් ගිණුම්කරණ පරිචයක් සොයා ගැනීමට නොහැකි බැවින් මෙම පශුධන සම්පත් ගිණුම්කරණ කටයුත්තෙන් බැහැර කර ඇති බව. | පශුධන සම්පත්වල වටිනාකම ගිණුම්ගත කළ යුතු වීම. |
| (ඌ) | සීතාඑළිය බීජ අර්තාපල් ගබඩාවේ සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2020 දෙසැම්බර් 31 දිනට පැවති බීජ අර්තාපල් තොගයේ වටිනාකම රු. 60,693,557 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සඳහා අදාළ බීජ අර්තාපල් තොගයේ අගය ලෙස නුවරඑළිය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ බිජ 2020 පෙබරවාරි 12 දිනැති අංක බී අග/සි/08 දරන ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද තොග අගය වන රු.53,087,084 ක් ඇතුළත් කර තිබුණි. ඒ අනුව තොග අගයෙහි රු. 7,606,473 ක වෙනසක් පැවතුණි. ඒ අනුව නිවැරදි තොග අගය කුමක්ද යන්න විගණනයට සනාථ කර ගැනීමට නොහැකි විය. | මේ සඳහා පිළිතුරු අදාළ අධ්‍යක්ෂවරයා වෙතින් නැවත විමසා ඇති බැවින් පිළිතුරු ලබාගෙන පසුව ඉදිරිපත් කරන බව. | තොග ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වීම සහ වර්ෂය අවසාන තොග නිවැරදිව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

1.6.5 **අග්‍රිම ශේෂය**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒසීඒ - 3 අනුව ඉදිරිපත් කර තිබූ අග්‍රිම ගිණුමෙහි ගිණුම් අංක 7002/81/19 හි ආරම්භක ශේෂය වූ රු.13,333,278 ක වටිනාකමට වෙනත් මූලාශ්‍රවලින් ලද අග්‍රිම ලැබීම වූ රු.32,205 ක් එකතු කර රු. 13,365,483 ක් වියදම් මඟින් පියවීම් කර තිබුණද එය අග්‍රිම ගිණුමෙහි වෙනම දක්වා නොතිබුණි. | අතපසුවීමකින් වටිනාකම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බැවින් ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් වටිනාකම් ඉදිරිපත් කිරීමට සටහන් කර තබා ගත් බව. | පසුගිය වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළව අග්‍රිම පියවීම වෙන් වෙන් වශයෙන් දැක්වීම සිදු කළ යුතු වීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දින මුදල් පොතට අනුව රු.53,812,759 ක් අග්‍රිම පියවීම් සිදු කර තිබුණද එය අග්‍රිම ගිණුම (ඒසීඒ - 3) හි සඳහන් කර නොතිබුණි. | අතපසුවීමකින් මුදල් මඟින් පියවීම තීරුවෙහි සටහන් කර නොමැති අතර, එවැනි වැරදි ඉදිරියේදී සිදු නොවීමට සටහන් කර ගත් බව. | අග්‍රිම ගිණුම නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |

1.6.6 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිපළ නඩත්තුව හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.12,175,459 ක් වූ ණයහිමි ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය සනාථනයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ණය හිමි ශේෂය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් යම් යම් කටයුතු උදෙසා වර්ෂ අවසානයේ දී ලබාදුන් මුදල් බව, එම නිසා මෙහි තහවුරුව ලේකම්වරයාගෙන් ලබාගත යුතු බව සහ ඒ සම්බන්ධයෙන් විටින් විට විමසීම් කළ ද පිළිතුරු ලැබී නොමැති බව | ශේෂ තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ගොවිපළ අත්තිකාරම් ගිණුමේ වත්කම් ඉවත් කිරීමේ පිරිවැය ලෙස රු.26,496,732 ක් දක්වා තිබුණද ඊට අදාළ ඉවත් කිරීම් ක්ෂය නිශ්චිතව ගණනය කිරීමට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කර අත්තිකාරම් ගිණුමට අදාළ සියලු වත්කම් නිවැරදිව ක්ෂය කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | වත්කම් ඉවත් කිරීම් ක්ෂය නිවැරදිව ගණනය කිරීමටත් ඊට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ පළමු මාස හතරට අදාළව පමණක් අග්‍රිම සැලැස්ම සකස් කර තිබූ අතර සැලැස්ම ඉක්මවා අග්‍රිම ඉල්ලුම් කර තිබුණි. ඉතිරි මාස අට සඳහා අක්මුදල් අවශ්‍යතාවය සැලැසුම් කිරීමෙන් තොරව අග්‍රිම ඉල්ලුම් කර තිබුණි. | කොවිඩ් 19 හේතුවෙන් හා 2020 ට අදාළ අයවැය සම්මත කර ගැනීම 2020 දෙසැම්බර් 20 වන තෙක් ප්‍රමාද වීම හේතුවෙන් අතුරු සම්මත ගිණුම් 3 ක් යටතේ කටයුතු කිරීම නිසා යෝජිත අග්‍රිම සැලැස්ම පිළියෙල කිරීමට නොහැකි වූ බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | අනිකුත් මාසවලට සාපේක්ෂව නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී පිළිවෙලින් රු.1,018,643,000 ක් හා රු.1,453,606,000 ක් ලෙස වැඩි අග්‍රිමයක් ඉල්ලුම් කර තිබුණි. එම මාසවල ලද අග්‍රිමයද ඉල්ලුම් කළ ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පැවතුණි. එසේ වුවද 2020 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරයට රු.53,812,759 ක් අග්‍රිම පියවා තිබුණි. ඒ අනුව මාසිකව අග්‍රිම ඉල්ලුම් කිරීම් නිවැරදිව සිදු කර නොතිබුණි. | නොවැම්බර් හා දෙසැම්බර් මස ගෙවීම් කටයුතු වැඩි වශයෙන් සිදුවන බැවින් ඇස්තමේන්තු ගත මුදල තුළ වැඩි අග්‍රිම ප්‍රමාණයක් ඉල්ලුම් කළද භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළ මුදලට සමාන මුදලක් නොලැබුණි. නමුත් 2020 දෙසැම්බර් 31 දින රුපියල් 53,812,759 ක මුදලක් භාණ්ඩාගාරයට පිය වූ අතර ඊට හේතු වූයේ දෙපාර්තමේන්තු ආදායම ඉහළ යාම හා විදේශ ප්‍රදාන හා වෙනත් ව්‍යාපෘති යටතේ මුදල් ප්‍රමාණයක් බැර වී තිබීම බව. | අවශ්‍යතාවය අනුව අග්‍රිම ඉල්ලුම් කළ යුතු වීම. |

### 2.2 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 85(1)(ඇ), මුදල් රෙගුලාසි 143(1) සහ 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු හැකිතාක් තාත්විකව හා නිවැරදිව සකස් කළ යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේතාංක 2003.02.18 සඳහා මූලික ඇස්තමේන්තුව වූ රු. 318,000,000 ක ආදායම රු. 340,000,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එසේ වුවද ශුද්ධ ආදායම රු.488,134,208 ක් වීමෙන් සංශෝධිත ඇස්තමේන්තු ආදායමට වඩා සියයට 44 ක් ඉපයීම් කර තිබුණි. | කෘෂිකාර්මික කටයුතු සඳහා ජනතාව වැඩි වශයෙන් යොමුවීම නිසා තෙවන කාර්තුව අවසාන වන විට අධික ලෙස ආදායමේ වර්ධන අනුපාතයක් පෙන්නුම් කළ අතර එයට සාපේක්ෂව නැවත වතාවක් ආදායම් සංශෝධනය කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළද, 2021 වර්ෂයේ අයවැය කෙටුම්පත් සකස් කර ඇති බැවින් නැවත වතාවක් සංශෝධනය කළ නොහැකි බව දන්වන ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීම හා සංශෝධනය කිරීම කළ යුතු වීම. |

**2.3 වියදම් කළමනාකරණය**

---------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------------- | ------------ |
| (අ) | සුළු පරිමාණ කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘතියට අදාළ වැය විෂයයට වෙන් කළ රු. 3,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනය වැය නොකර සම්පූර්ණයෙන් ඉතිරි කර තිබීමෙන් සුළු පරිමාණ කෘෂිකාර්මික පර්යේෂණ කාර්යයන් මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කරගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුමක් ඇරඹීමෙන් පසු මෙම වැය සම්මතය සඳහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම නිදහස් කරන අතර එවැන්නක් සිදුවී නොමැති බවත් මෙම වර්ෂයේ උක්ත ගැටළුකාරී තත්ත්වය මගහරවා ගැනීම සඳහා මෙම වැය සම්මතයම මූල්‍යකරණය 13 යටතේ ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | වෙන්කරන ලද ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2020 තුන්වන කන්නයේ මුං සහ කව්පි විශේෂ වගා වැඩසටහන යටතේ මුං හෙක්ටයාර් 20000 ක හෙවත් අක්කර 49420 ක් වූ වගා වපසරියක ක්‍රියාත්මක කිරීම සඳහා සැලැසුම් කර තිබුණි. එහිදී අක්කරයක් සඳහා කිලෝග්‍රෑම් 10 බැගින් මුං බීජ ලබා දීමට කිලෝග්‍රෑම් එකක් රු. 330 බැගින් වන සේ පිරිවැය නිර්ණය කර තිබුණි. ඒ අනුව අක්කරයට කිලෝග්‍රෑම් 10 බැගින් අක්කර 49420 ක් සඳහා අවශ්‍ය මුං බීජ ප්‍රමාණය කිලෝග්‍රෑම් 494200 ක් හා එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.163,086,000 ක් විය. ක්‍රියාකාරී සැලසුමේ හා අනුමත වැඩසටහන සඳහා රු.180,000,000 ක් ප්‍රතිපාදන වෙන් කිරීම හේතුවෙන් රු.16,914,000 ක් අධි ඇස්තමේන්තු කිරීමක් සිදු කර තිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය මගින් රටෙහි බීජ සුලභතාව අනුව හා නිෂ්පාදනය සඳහා වන වියදම් සැලකිල්ලට ගෙන බීජ මිල වෙනස්වීම් සිදු කරනු ලබයි. එබැවින් මිලෙහි වන සුළු විචලයන්ටද ඉඩ ප්‍රස්ථාව තබමින් මිල ඇස්තමේන්තු කර ඇත. විමසුමේ සඳහන් පරිදි රු.16,914,000 ක අධි ඇස්තමේන්තුවක් වුවද එහිදී මිල ඉහළ ගියහොත් බීජ කි.ග්‍රෑම් 1 ක් රු. 360 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. (එවක මිල වූයේ කි.ග්‍රෑම්. 1 ක් සඳහා රු. 320 කි.) මෙලෙස සිදු නොකලහොත් බීජ මිල වැඩි වීමකදී ලබා දිය හැකි බීජ ප්‍රමාණය අඩුවීමෙන් වගා ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවීමෙන් නිෂ්පාදනය අඩුවී අරමුණු සඵල කර ගැනීමට නොහැකි බව. | ඇස්තමේන්තු වඩාත් නිවැරදිව සිදු කළ යුතු වීම. |

**2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------- | ----------- |
| ව්‍යාප්ති හා පුහුණු හා ආර්ථික සේවා ගිණුම් ශාඛාවන්ට අදාළ 2021 ජනවාරි මාසයේ ගෙවීම් සම්බන්ධ වවුචර් පරීක්ෂාවේදී අවස්ථා 65 කදී සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවා | මෙම වවුචර්පත් ගෙවීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොතිබූ හෙයින් CIGAS වැඩසටහන මගින් බැරකම් ලෙස දැක්විය නොහැකිය. එසේ වුවත්, මෙම | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| තිබුණු එකතුව රු.1,632,944 ක වියදම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 94 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සටහන (iii) බැදීම් හා බැරකම් පිළිබද ප්‍රකාශයේ බැරකම් ලෙස දක්වා නොතිබුණි. | වවුචරපත්වලට අදාළ වියදම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා අත්‍යවශයෙන්ම දැරිම යුතු වියදම් බැවින් 2021 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගෙවීම් කටයුතු සිදුකර ඇති බව. | |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

---

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4:2:2, 4:2:4, 4:2:5, 4:3, 4:4, 4:5, 4:6 හා 6:3 වගන්ති අනුව මියගිය, විශ්‍රාම ගිය, සේවා කාලය ප්‍රමාණවත් නොවීම නිසා විශ්‍රාම වැටුපක් රහිතව විශ්‍රාමගිය වැඩ තහනම් කර ඇති, විදේශගතව සේවය හැර ගිය හා මධ්‍යගත කිරීම යටතේ විවිධ අංශ මඟින් මාරු කර තිබූ නිලධාරීන් 92 කට අදාළව එකතුව රු.5,369,088 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතුව පැවතුණි. | මුදල් රෙගුලාසි පරීක්ෂණ කටයුතු අවසන් නොවීම, විශ්‍රාම ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීම ප්‍රමාද වීම හා ඇතැම් අයනොවන ශේෂ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කරනු ලබන බව. | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 11 හි 5.2 ඡේදය ප්‍රකාරව දේපල ණයක් ලබාගෙන ඇති ණයකරු ණය වාරික නොපියවන්නේ නම් නීතිපතිගේ උපදෙස් මත අදාළ දේපල වෙන්දේසි කර එම හිඟ ණය ශේෂය පියවා දැමීමට කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය කළ නිලධාරීන් හා සේවකයින් 08 දෙනෙකුට අදාළ එකතුව රු. 805,234 ක ණය සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ඇතැම් නිලධාරීන් ඇප ඔප්පු ලබා දී නොතිබීම මත අයකර ගැනීමට නොහැකි වී ඇති බවත් ඒ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග කටයුතු සිදුවේ. ඇතැම් ණය ශේෂ මුදලින් ගෙවීමට එකග වී ඇති බවත් ඇතැම් දේපල වෙන්දේසි කිරීමට කටයුතු කර ඇති බව. | අදාළ හිග ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම් 05 කට අදාළව වසර 18 ත් වසර 28 ත් අතර කාලයක් ඉක්ම වූ අනුමත නොකළ සමුච්චිත කාරක පාඩුවල එකතුව රු.67,146,096 ක් හා විෂය අංක 285-05 දරන සහතික කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුමට අදාළ වර්ෂ 28 ක් ඉක්මවා තිබුණු පියවිය යුතු ශේෂය රු.76,157 ක් විය. | මෙම කාර්යය ප්‍රමුඛ කාර්යයක් සේ සළකා අප විසින් ගතහැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගනිමින් කටයුතු සිදුකර ඇති අතර, ඉදිරියේදී මෙම කරුණ රාජ්‍ය ගිණුම් කාරක සභාවක සාකච්ඡාවට ගැනීමෙන් අනතුරුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර මෙම ඇවර කළ අත්තිකාරම් ගිණුම් සම්පූර්ණ වශයෙන් අවසන් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ඇවර කිරීමේ කටයුතු සිදු කළ යුතු වීම. |

**2.6 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පත් ගිණුම් 04 ට අදාළ වර්ෂ 02 ඉක්ම වූ වටිනාකම රු.7,859,871 ක් වූ තැන්පතු 20 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570, 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඇතැම් තැන්පතු බේරුම් කරන ක්‍රියාවලිය අවසන්ව නොමැති බැවින්, අඩුපාඩු සකස් කිරීමට ඇති බැවින්, නැවත පරීක්ෂා කරන තෙක් රඳවා තබා ගෙන ඇති බවත් SARCC සංවිධාන අරමුදල විසින් විගණනයක් කිරීමෙන් පසු ගෙවීම් කටයුතු කරන ලෙස රු.4,015,531 ක මුදලක් රඳවාගෙන ඇති බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| xix පරිච්ඡේදයේ 6.1 වගන්තිය | යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියලුම නිවාසවල බදු කාලය වර්ෂ 05 ක් වුවද සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ආයතන 02 ක නිලධාරීන් 19 දෙනෙකු වර්ෂ 05 ඉක්මවා වසර 04 සිට වසර 11 දක්වා කාලයක් රජයේ නිවාසවල අඛණ්ඩව පදිංචි වී තිබුණි. | රජයේ නිවාසවල වසර 5 ඉක්මවා පදිංචිව ඇති නිවාස නැවත ලබා ගැනීමට හා පොරොත්තු ලේඛනයේ සිටින නිලධාරීන්ට නිල නිවාස ලබාදීමට මේවන විට කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට හා ඊට අයත් ප්‍රාදේශීය ඒකකවලට අදාළ වසර 01 සිට වසර 32 ක් දක්වා කාලයක් ඉක්ම වූ අවස්ථා 110 කදී සිදු වී තිබුණු රු.19,443,173 ක් වටිනා හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරීක්ෂණ කටයුතු පවත්වා පොදු 283 කෘ.අ.ජ. වෙත ඉදිරිපත්කර ඇති අවස්ථා 42 ක්, පොදු 284 කෘ.අ.ජ. වෙත ඉදිරිපත්කර ඇති අවස්ථා 44 ක්, පොදු 284 අනුමැතිය ලත් අයවීම් අවසන්වී නැති අවස්ථා 10 ක්, පොදු 285 කෘ.අ.ජ. වෙත ඉදිරිපත්කර ඇති අවස්ථා 11 ක් හා පොතෙන් කපාහැරීමට ඒකකය වෙත දන්වා ඇති අවස්ථා 4 ක් ඇතුළත් බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 175(2) | ගොවිපළ අත්තිකාරම් ගිණුමට අදාළව වර්ෂ 01 ට වැඩි රු.3,275,852 ක් වටිනා ණයගැති ශේෂ 67 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | මෙම ණය අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් කමිටුවක් මගින් අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | -එම- |
| (iii) | මුදල් රෙගුලාසි 753 | භාණ්ඩ නිකුත් කිරීමේදී හා ලැබීමේදී නිකුත් කිරීමේ ඇණවුමක් සහ ලැබීම් ඇණවුමක් පිළියෙල කළ යුතු වුවද, වටිනාකම රු. 7,373,000 ක් වූ ජංගම සූර්ය බල ජල පොම්ප කට්ටල හා ජංගම විසුරුම් ජල පද්ධති 60 ක් සඳහා හා වටිනාකම රු. 17,727,230 ක් වූ විදුලි වැට 869 ක් බෙදාහැරීමට අදාළව ලැබීම් නියෝග ගෙන්වාගෙන නොතිබුණි. | සැපයුම්කරු විසින් එනජයිසර් උපකරණ ප්‍රාදේශීය කෘෂිකර්ම ව්‍යාප්ති අංශවලට බෙදා හැර ලිඛිතව භාර ගත් බවට වූ සටහන් ව්‍යාප්ති හා පුහුණු අංශය වෙත ඉදිරිපත් කර ඇති බව. | -එම- |
| (iv) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009 පෙබරවාරි 20 වැනි දින නිකුත් කරන ලද අංක 1589/30 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යය පරිපාටික රීති I වැනි කාණ්ඩයේ xviii වන පරිච්ඡේදයේ 202 රීතියේ විධි විධාන | ආයතන 09 කට අයත් නිලධාරීන් 85 දෙනෙකු වසර 05 කට වැඩි කාලයක් එකම ආයතනයක සේවය කර තිබුණි. | වාර්ෂික ස්ථානමාරු ඉල්ලීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත තොරතුරු යොමු කර තිබුන ද ස්ථාන මාරු ලැබී නොමැති බවත් ඇතැම් නිලධාරීන් මේ වන විට උසස් වීම් ද ලබා වෙනත් සේවා ස්ථානවල සේවයට වාර්තා කර ඇති බව. | කාර්යපරිපාටික රීති හා විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.8 අවිධිමත් ගනුදෙනු**

-------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින වන විට මී මැසි පෙට්ටි 500 ක් මිලදී ගැනීමට අදාළව එකතුව රු.762,500 ක මුදලක් බිඳුණුවැව බණ්ඩාරවෙල මී මැසි සංවර්ධන ඒකකයට හා දෙහිඕවිට පඹසරා මී මැසි පෙට්ටි නිෂ්පාදන ආයතන වෙත 2020 දෙසැම්බර් 31 දින වන විට චෙක්පත් ලියා තිබුණද, අදාළ ආයතන විසින් එදින වන විට මී මැසි පෙට්ටි 351 ක් පමණක් ලබා දී තිබුණි. | මේ වන තෙක් නිෂ්පාදකයින් වෙත අදාළ ගෙවීම් සිදු කර නොමැති බව. | මුදල් රෙගුලාසි 215 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------------- | ----------- |
| (අ) | සුළු පරිමාණ ව්‍යාපාර සංවර්ධනය තුළින් ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 02 ක් සඳහා ප්‍රතිපාදිත රු.16,175,000 ක මුදලින් උපයෝජනය රු.5,388,000 ක් විය. ඒ අනුව රු.10,787,000 ක් එනම් සියයට 67 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | පොලි සීලර් යන්ත්‍ර සඳහා මිළ ගණන් ඉදිරිපත් නොවීම සහ නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරිමට කාලයක් නොමැති වීම හේතුවෙන්, පොලි සීලර් යන්ත්‍ර මිළදී ගැනීම සිදු නොවුණි. බිම්මල් ඇසුරුම් මේස 80 සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරිමට නොහැකි වීම හේතුවෙන් බිම්මල් ඇසුරුම් මේස 80 මිළදී ගැනීම සිදු නොවූ බවත් මී මැසි පෙට්ටි 250 ක් අඩු මුදලකට ලබා ගැනීමට හැකිවීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | සමාජ ආර්ථික සැලැසුම් මධ්‍යස්ථානයේ දැක්ම හා මෙහෙවර කරා ළඟාවීමට නම් අනිවාර්යයෙන්ම පර්යේෂණ හා අධ්‍යයනවල නියැලෙන නිලධාරීන් ක්ෂේත්‍රයට යාම තුළින් පර්යේෂණයන් සිදු කිරීම සඳහා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගැනීම සිදු කළ යුතු වුවද, සමාජ ආර්ථික සැලැසුම් මධ්‍යස්ථානයේ සේවයේ නිරත කෘෂි ආර්ථික විද්‍යාඥවරුන් පසුගිය වර්ෂ 04 ක පමණ කාලයක සිට අදාළ කාර්යභාරය වෙනුවෙන් ක්ෂේත්‍රයට ගොස් එලෙස ගැටළු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා ) මගින් කෘෂි ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයට අදාල ගැටළු හඳුනා ගැනීම සිදු කිරීම සඳහා ප්‍රාදේශීය තාක්ෂණ ක්‍රියාකාරී කමිටුව (PTWG) වෙතට ඉදිරිපත්වන පර්යේෂණ ගැටළු ප්‍රධානව පාදක කර ගන්නා බව හා ජාතික වශයෙන් කරනු ලබන අවශ්‍යතාවයට සරිලන පර්යේෂණ වල හා ආර්ථික විද්‍යාඥයින් විසින් න්‍යායාත්මක ගැටළු හඳුනා ගෙන පර්යේෂණ සිදු කරන බව. | ක්ෂේත්‍රයේ පවතින සමාජ ආර්ථික ගැටලු හඳුනාගෙන පර්යේෂණ සිදු කිරීම හා එම පර්යේෂණ ප්‍රතිඵල කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේදී මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ මී පැණි නිෂ්පාදකයින් හා පැණි නිෂ්පාදනය පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම බිඳුනු වැව මී මැසි සංවර්ධන ඒකකයේ ප්‍රධාන කාර්යභාර්යක් විය. එහෙත් 2016 වර්ෂයෙන් පසු එලෙස තොරතුරු එක් රැස් කිරීමක් සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් දිවයින පුරා මී | මී මැසි පාලන දත්ත එක්රැස් කිරීමේදී පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වරුන් හා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වරුන් වෙත එම ආකෘති පත්‍ර යැවීම සිදු කර ඇති බව සහ එහිදී ඔවුන් විසින් තොරතුරු නැවත ලබා දීම අවම මට්ටමක පැවතීම හේතුවෙන් වාර්ෂිකව | ආයතනයේ ප්‍රධාන කාර්යභාරයන් ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පැණි නිෂ්පාදකයන් කොපමණ ප්‍රමාණයක් සිටීද වාර්ෂික පැණි නිෂ්පාදනය දේශීය අවශ්‍යතාවයට ප්‍රමාණවත් වේද , මී පැණි නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා ගත යුතු ක්‍රියා මාර්ග, වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කළමනාකරණයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ක්‍රමවේදයක් නොතිබුණි. | එම සියළු දත්ත එකතු කර වාර්තාවක් සකස් කිරීමට අපහසු වී ඇති බව. | |
| (ඈ) | 2020 තුන්වන කන්නයේ මුං සහ කව්පි විශේෂ වගා වැඩසටහන යටතේ ප්‍රාදේශීය මුං වගා සම්මේලන කමිටු හා දිස්ත්‍රික්කයේ ඇති මුං වගා ප්‍රාදේශීය සම්මේලන ඒකරාශී කර දිස්ත්‍රික් මුං වගා ප්‍රාදේශීය සම්මේලනය දිසාපතිතුමා, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, ගොවිජන සේවා කොමසාරිස්, වාරිමාර්ග අධ්‍යක්ෂ, නේවාසික ව්‍යාපාර කළමනාකරු, කලාප භාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය සම්මේලනයේ සභාපතිවරුන් ලේකම්වරුන් හා භාණ්ඩාගාරිකගෙන් සමන්විතව පවත්වා නොතිබුණි. | තොරතුරු කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බවටත් මේ සම්බන්ධයෙන් අදාළ අධ්‍යක්ෂවරයා වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | ව්‍යාපෘතියේ අරමුණු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් ඉටු කිරීම කළයුතු වීම. |
| (ඉ) | මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ ගොවීන්ගේ අලෙවි ප්‍රශ්න විසඳීමට ජාතික ආහාර සුරක්ෂිතතාවයට මහ පෙන්වීම සහ කෘෂි තොරතුරු හුවමාරුව සඳහා දිවයින පුරා පිහිටි ගොවිජන කේන්ද්‍ර 550 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන සමග ජාලගත කිරීම එක් අරමුණක් කරගනිමින් ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය පිහිටුවා තිබුණද 2020 දෙසැම්බර් 31 දින විටත් එලෙස ජාලගත කිරීමක් සිදු කර නොතිබුණි. | ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය මඟින් ලබා දෙන සේවය ප්‍රවර්ධනය කිරීම හා ජාතික තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම යන මූලික අරමුණු දෙක සාක්ෂාත් කිරීමට හැකි වන සේ ගොඩනැඟිලි පහසුකම් ලබා දීම සඳහා 2012 සැප්තැම්බර් මස NPD/AG/CM/12/11 අංක දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා දී ඇත. ජාලගත කිරීම සම්බන්ධව ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර, ජාලය ස්ථාපිත කිරීමේ අරමුණ සඳහා මෙම අංශය අඛණ්ඩව උත්සහ කර ඇති බව. | අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | තරුණ ගොවි සමාජ ව්‍යාපාරය 2015 සිට වසර 05 කදි සමාජ 5,000 ක් සහ ප්‍රතිලාභී යෞවන යෞවනියන් 250,000 ක් ලෙස ඉලක්ක කර පැවතුණද වර්තමානය වන විට සමිති 535 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. එය ඉලක්කගත ප්‍රතිශතයෙන් සියයට 10.7 ක් වැනි ඉතා අඩු අගයක් විය. | තරුණ ගොවි සමාජයක් පිහිටුවා මාස 06 ක කාලයක් එය ක්‍රියාකාරීව පැවතීමෙන් පසුව පමණක් එය තරුණ ගොවි සමාජ මූලස්ථානයේ ලියාපදිංචි කරනු ලබයි. එම නිසා ඉලක්කගත ප්‍රතිශතය 10.7 ක අගයක් ලෙස පෙන්නුම් කරන බව. | අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | පිදුරුතලාගල ගොවිපළෙහි බීජ අර්තාපල් ගබඩා 09 ක් නැවත වයරින් කිරීම සඳහා වටිනාකම රු.280,770 ක් වූ වයරින් උපකරණ මිලදීගෙන තිබුණද, 2020 අගෝස්තු 19 දින වන විට එක් ගබඩාවක් පමණක් වයරින් කර තිබුණි.තවද ගොවිපළෙහි අංක 04 සහ 05 ගබඩා අළුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් 2019 වර්ෂයේ නොවැම්බර් මස ඉදිකිරීම් ආයතනයක් වෙත රු.299,270 ක මුදලකට ප්‍රදානය කර තිබුණද අදාළ ඉදිකිරීම් කටයුතු විගණිත දිනය වූ 2020 අගෝස්තු 19 දින වන විටද ආරම්භ කර නොතිබුණි. | ගොවිපළෙහි වයරින් කටයුතු සිදු කර ගැනිම සඳහා ප්‍රමාණවත් කාර්මික දැනුමක් සහිත සේවකයෙකු නොමැති බැවින්, සීතාඑළිය ශාබාගාර සංකීර්ණයේ සේවයේ නියුතු නිළධාරියෙකු ගොවිපල වෙත ගෙන්වා ගෙන ගබඩාවන් දෙකක පමණක් වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. අනෙක් ගබඩාවන්හි කටයුතු ඉදිරියේදී අවසන් කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | අදාළ කාර්යයන් නියමිත කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතිරේක ක්ෂේත්‍ර බෝග 10 ක දේශීය බීජ නිෂ්පාදනය පරීක්ෂාවේදී එම බෝගවල බීජ නිෂ්පාදනය ජාතික බීජ අවශ්‍යතාවයෙන් සියයට 50 කට අඩු ප්‍රතිශතයක් වන අතර බඩ ඉරිඟු (විවෘත පරාගණය) හා ලොකු ලූණු නිෂ්පාදනය ජාතික බීජ අවශ්‍යතාවයෙන් සියයට 01 කට වඩා අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. | ජාතික බීජ අවශ්‍යතාවට සාපේක්ෂව අප අංශයට නිෂ්පාදනය කළ හැකි බීජ ප්‍රමාණයන් ඇස්තමේන්තු කරන අතර, එම ප්‍රමාණය ජාතික අවශ්‍යතාවයෙන් සියයට 25 ත් සියයට - 50 ත් අතර අගයක් ගනී. බඩඉරිඟු බීජ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශයේ නිෂ්පාදනය සියයට 9.2 ක් වන අතර, ගොවීන් අතර වැඩිපුර ප්‍රචලිත වී ඇත්තේ ආනයනික දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේද වේ. ඉදිරියේ දී ගොවීන් අතර වඩා ප්‍රචලිත ප්‍රභේදයක් හඳුන්වා දීම තුළින් බඩඉරිඟු බීජ නිෂ්පාදනය ද අවශ්‍යතාව අනුව වැඩිකිරීමට හැකියාව ඇති බව. | දේශිය වශයෙන් බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) | සමාජ ආර්ථික සැලැසුම් මධ්‍යස්ථානයේ අනුමත කෘෂි ආර්ථික විද්‍යාඥ නිලධාරීන් සංඛ්‍යාව 23 ක් වූ අතර විගණිත දිනය වූ 2020 ඔක්තෝබර් 23 දින වන විට ඉන් නිලධාරීන් 11 ක් සේවයේ නිරත විය. නමුත් මෙම මධ්‍යස්ථානය මඟින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව පසුගිය වසර 3 ක කාලය තුළ නියැලී තිබූ පර්යේෂණ හෝ අධ්‍යයන ගණන 17 ක් වැනි ඉතා පහළ අගයක් ගෙන තිබුණි. | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (ආර්ථික විද්‍යා) මඟින් ක්‍රියාකරනු ලබන පර්යේෂණ වාර්තා ගණන නිලධාරින්ගේ හෝ ආයතනයේ කාර්යක්ෂමතාවය මැන බැලීමට සිදුකරනු ලබන වඩාත් උචිත මිනුමක් නොවන බවත් ප්‍රකාශයට පත්කරනු ලබන අධ්‍යනයන් ගණන හා සිදුකරනු ලබන අධ්‍යනයන් ගණනට වඩා අඩු බවත් | ගොවීන්ගේ සමාජ ආර්ථික ගැටළු හඳුනාගෙන ඒ සඳහා වඩාත් ඵලදායී විසඳුම් ඉදිරිපත් කිරීමට පර්යේෂණ අඛණ්ඩව සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | එමෙන්ම එක් එක් අධ්‍යානයන් සඳහා ගතවන කාලය එකිනෙකට වෙනස් වන බවත් එමෙන්ම එක් එක් අධ්‍යානය ජාතික ලෙස වන දායකත්වයද විවිධය. එමෙන්ම ඉහල ගුණත්වයකින් යුතු පර්යේෂණ සිදුකිරීමට අදාළ මෘදුකාංග ලබා ගැනීමේ ගැටළුද පර්යේෂණ පත්‍රිකා සීමා වීමට හේතු වන බව. | |
| (ඇ) | පලතුරු වගාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයක් වුවද බෝග පුරෝකතන වාර්තා සඳහා පලතුරු පිළිබඳව දත්ත ඇතුළත් කර නොතිබුණි. තවද කොළ එළවළු සම්බන්ධයෙන්ද තොරතුරු අදාළ ආකෘතිය ප්‍රකාරව ලබාගැනීමට කටයුතු කර තිබූ නමුත් ඊට අදාළ දත්තයන්ද වාර්තාවලට ඇතුළත් කර නොතිබුණි. | පලතුරු බෝග සඳහා වන දත්ත බෝග පුරෝකතන දත්ත පද්ධතිය වෙතට ඇතුළු කිරීමට අවශ්‍ය පරිගණක මෘදුකාංග නිර්මාණය කළ ද ඒ තුළ සිදු වූ තාක්ෂණික ගැටලු නිසා මෙම තත්ත්වය නිවැරදි කර ඉදිරියේදි අදාළ දත්ත ඇතුළු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | බෝග පුරෝකතන වාර්තාව මගින් වඩාත් නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ සිදුකරන ලද ශ්‍රී ලංකාවේ තෝරාගත් ආහාර බෝගවල මිල විශ්ලේෂණය (Price analysis of selected food crops in sri lanka ) නැමැති අධ්‍යයනයට අදාළ වාර්තාව 2020 ඔක්තෝබර් 23 දින වන විටත් නිකුත් කර නොතිබූ අතර ඉකුත් වර්ෂයේ සිදුකිරීමට අපේක්ෂා කරන ලද වී ගොවීන් විසින් අඩවි විශේෂිත පොහොර කළමනාකරණ පිළිවෙත් විශ්ලේෂණය කිරීම (Analysis of the adoption of site- specific fertilizer management practices by paddy farmers) නැමැති අධ්‍යයනය 2020 ඔක්තෝබර් 23 දින වනවිටත් සමාජ ආර්ථික සැලැසුම් මධ්‍යස්ථානය විසින් ආරම්භ කර නොතිබුණි. | මෙම අධ්‍යයනයන් වෙනත් ආයතන හා එක්ව සිදු කරන අතර, එම ආයතන වල දත්ත ලබා ගෙන (ද්වීතීක දත්ත) ඒ මත පදනම් වි සිදුකරන අධ්‍යයනයන් වේ. වෙනත් ආයතන හා එක්ව සිදුකරන අධ්‍යයනයන් වලදී දත්ත ලබා ගැනීම ක්‍රම වේදයේ දුෂ්කරතාවයන්, අවශ්‍ය කරන දත්ත නොමැති විම, අඛන්ඩව වසර කිහිපයක දත්ත නොමැති වීම, එම ආයතනවල නිලධාරීන් වෙනස් වීම පර්යේෂණ ප්‍රමාද විමට හේතු වන බව. | පර්යේෂණ සැලැස්මක් සකස් කර ඒ අනුව පරයේෂණ කටයුතු සිදු කිරීම තුළින් නියමිත කාලය තුල පර්යේෂණ නිම කළ හැකි වීම. |
| (ඉ) | 2020 තුන්වන කන්නයේ මුං සහ කව්පි විශේෂ වගා වැඩසටහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉතා වැදගත් සාධකයක් වූ බීජ සම්පූර්ණයෙන්ම සැලැසුම් කළ පරිදි ලබා ගැනීමට අපොහොසත් වී තිබූ අතර, සැලැසුම් කරන ලද හෙක්ටයාර 22,500 න් හෙක්ටයාර 10074 මුං හා හෙක්ටයාර 174 කව්පි ලෙස වගාකර තිබුණි. එය අපේක්ෂිත ප්‍රමාණයෙන් මුං සියයට 50.37 ක් හා කව්පි සියයට 6.9 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | මේ සඳහා පිළිතුරු අදාල අධ්‍යක්ෂවරයා වෙතින් නැවත විමසා ඇති බැවින් පිළිතුරු ලබාගෙන පසුව ඉදිරිපත් කරන බව. | සැලැසුම් කිරීම නිසි අධ්‍යානයකින් පසුව සිදු කිරීමත් අපේක්ෂිත ඉලක්ක ළගාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2014 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාව තුළ කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගත් ගොවීන් 2310000 ක් පමණ සිටින අතර ඔවුන් වෙත කාලගුණික වෙනස්වීම් සම්බන්ධව දැනුවත් කිරීම සඳහා කාලගුණ අනාවැකි ඇඟවීමේ කෙටි පණිවිඩ යැවීමේ පද්ධතියක් රු. 1,179,074 ක වියදමින් සකස් කර තිබුණි. නමුත් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය අතර කාලය තුළ ලියාපදිංචි ගොවීන් 3164 ක් සඳහා පණිවුඩ 13 ක් වැනි ඉතා අඩු ප්‍රමාණයක් පමණක් යවා තිබුණි. | ලියාපදිංචි වූ ගොවීන්ගේ සංඛ්‍යාව 3000 ක් පමණ බවත් මෙම SMS පණිවිඩය සඳහා මුදලක් අය වන බැවින් සියලු ගොවීන් ආවරණය කිරීමේ ප්‍රායෝගික අපහසුතාවයක් ඇති බවත් ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ලබා දෙන කෙටි පණිවිඩ පමණක් භාෂා තුනෙන්ම SMS මඟින් බෙදා හරිනු ලබන බව. | ලියාපදිංචි ගොවීන් සංඛ්‍යාව වැඩිකර ඵලදායීව මෙම සේවාව සැපයීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතු වීම. |
| (උ) | අංශ 03 ක ව්‍යාපෘති 22 කට අදාළ ක්‍රියාකාරකම් 2020 දෙසැම්බර් 31 දිනට සියයට 100 ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කළද 2020 දෙසැම්බර් 31 දිනට සියයට 0 ත් සියයට 50 ත් අතර අවම ප්‍රගති මට්ටමක් ළඟාකරගෙන තිබුණි. | කොවිඩ්-19 වසංගත තත්ත්වය, ස්වභාවික තත්ත්වයන් හා ප්‍රතිපාදන නියමිත කාලය තුළ නොලැබීම මෙම ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇති බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඌ) | මුං හා කව්පි නිෂ්පාදනය වැඩිකිරීම සමාලෝචිත වර්ෂයේ තුන්වන කන්නයේ මුං සහ කව්පි විශේෂ වගා වැඩසටහනේ එක් අරමුණක් විය. නමුත් සියයට 50 දායකත්වය යටතේ ගොවීන් වෙත ලබාදී තිබූ මුං හා කව්පි නිෂ්පාදනය කරන ලද ගොවීන් විසින් පමණක් කොපමණ නිෂ්පාදනයක් සිදුකළේද යන්න ඇගැයීමක් හා තොරතුරු රැස්කිරිමක් සිදුකර නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ නිමවුම (Out put) ලෙස මුං හෙක්ටයාර එකකට මෙට්‍රික් ටොන් 0.8 (800kg) - මෙට්‍රික් ටොන් 1.2 (1200kg) දක්වා තිබුණද, ඉදිරිපත් වූ තොරතුරු අනුව දිස්ත්‍රික්ක 07 ක මුං වගාවේ ඵලදායිතාවය හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 0.13 සිට 0.82 පරාසයක පැවතුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත නිමැවුමෙන් ළඟා කර නොගත් නිමැවුම මෙට්‍රික් ටොන් 12,267 ක් හෙවත් සියයට 69.30 ක් පමණ විය. මෙම ව්‍යාපෘතිය මගින් පසු අස්වනු තාක්ෂණය වැඩි කිරීමට බීජ පියළි කිරීමේ යන්ත්‍ර ලබා දිමට හඳුනාගෙන තිබුණද එය සිදුකර නොතිබුණි. | අතරමැදි කන්නයක සිදු කරනු ලබන වගාවකදි බෝගය සඳහා ජල සම්පාදනය හෝ වර්ෂා ජලය ලැබීම සුවිශේෂී සාධකයක් බව මෙම වගාව මෙම කන්නයේදී කුඹුරු ඉඩම් වල සිදු කිරීම නිසා එහිදී ජලය හිඟ වීම හෝ ජලය වැඩිවීම ඵලදායිතාවය අඩුවීමට හේතුවන බව, එසේම ඇතැම් ප්‍රදේශවල පැවති පළිබෝධ හානි ද ඵලදායිතාව අඩුවීමට තවත් හේතුවක් බව මෙම වගාව පමණක් එම කාලයේදී ක්ෂේත්‍රයේ පවතින බැවින්, තාක්ෂණික උපදෙස් ලබා දී ඇති බව හා අවම කර ගැනීමට කටයුතු කලත් යම් මට්ටමක හානි වීම් සිදුවීම ද ඵලදායිතාව අඩුවීමට හේතු වූ බව. | මුං වගාවේ ඵලදායීතාවය ඉහල නැංවීම ව්‍යාපෘතියේ එක් අරමුණක් විය. එබැවින් හෙක්ටයාරයකට ලබා ගතහැකි අසවැන්න වැඩි කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (එ) එළවළුවල දේශීය බීජ අවශ්‍යතා සැලකීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළවල හා කොන්ත්‍රාත් වැඩ සටහන යටතේ නිපදවන සම්මත හා මූලික බීජ වර්ග 12 ක සමස්ත බීජ නිෂ්පාදනය දේශීය බීජ අවශ්‍යතාවයේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.9 සිට සියයට 15.4 අතර පරාසයක පැවතුණි. | එළවළුවල දේශීය බීජ අවශ්‍යතාවයෙන් යම් ප්‍රතිශතයක් පමණක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළවල නිෂ්පාදනය හා කොන්ත්‍රාත් නිෂ්පාදන මඟින් ලබාදීමට හැකියාවක් ඇති බවත් ප්‍රධාන වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වනුයේ නිර්දේශීත එළවළු ප්‍රභේදවල මූලික බීජ නිෂ්පාදනය කිරීම බව. | දේශිය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආනයනික දෙමුහුම් බීජ නිෂ්පාදනය තුළින් තරඟකාරී වෙළඳපළක් දේශීයව ඇති කර ආනයනික වියදම් සීමා කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හැකියාව තිබුණද පසුගිය කන්න 05 ක රජයේ බීජ නිෂ්පාදන ගොවිපළවල දෙමුහුම් එළවළු බීජ තක්කාලි, වම්බටු, පිපිඤ්ඤා හා මාළු මිරිස්වලට අදාළව කිලෝග්‍රෑම් 199 ක් වැනි ඉතා අඩු නිෂ්පාදනයක් කර තිබුණි. | දෙමුහුම් බිජ නිෂ්පාදනය සඳහා ආරක්ෂිත ගෘහ ප්‍රමාණවත් තරම් නොමැති විම හා තක්කාලි, පිපිඤ්ඤා සහ වම්බටු යන බෝගවල බිජ ප්‍රමාණවත් තරම් තොග පැවතීම බිජ නිෂ්පාදනය අඩුවීමට හේතුව ලෙස පෙන්වා දිය හැක. කරවිල හා මාළු මිරිස් වල මාතෘ පෙළපත්වල පැවති ගැටලු හඳුනා ගෙන පරීක්ෂණ අංශය මඟින් ශුද්ධ පෙළපත් ලබා දෙන තෙක් නිෂ්පාදනය කළ නොහැකි විය. පරීක්ෂණ අංශය මඟින් ලබා දී ඇති ශුද්ධ පෙළපත් භාවිතා කර 2020/2021 යල කන්නයේ සිට දේශිය දෙමුහුම් බිජ නිෂ්පාදනය ගොවිපළවල ආරම්භ කර ඇති අතර, නව නිර්දේශිත දෙමුහුම් බිජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති බව. | දෙමුහුම් බීජ සඳහා ගොවීන් අතර වැඩි ඉල්ලුමක් පවතින බැවින් දේශීය දෙමුහුම් බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාර්ෂිකව බඩ ඉරිඟු බීජ සියයට 98 ක් පමණ ආනයනය කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ බඩ ඉරිඟු බීජ සඳහා රු.මිලියන 1,306 ක පිරිවැයක් දරා තිබුණි. එසේ වුවද පර්යේෂණ නිලධාරීන්ගේ දායකත්වය මත ගොවීන්ගේ ඉල්ලුමට සරිලන පරිදි දේශියව බඩඉරිගු බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අවධානය යොමු වී නොතිබුණි. | කෘෂිකර්ම දෙපර්තමේන්තුවේ මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ ආයතනය මගින් ආනයන බඩ ඉරිඟු බීජ සඳහා තරඟ කළ හැකි නව ප්‍රභේදයක් හඳුන්වා දීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට කටයුතු කරන බව. | දේශීය බීජ නිෂ්පාදනය ඉහල නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ඇ) | සමාජ ආර්ථික සැලැසුම් මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කරනු ලබන එළවළු වගාව පිළිබඳ පූර්ව දැනුම්දීමේ වැඩසටහන ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වැඩ සටහනකි. එළවළු හිඟයක් හෝ අතිරික්තයකින් තොරව පවත්වාගෙන යාම සඳහා මෙම වැඩසටහන ආරම්භ කර පැවතුනද රට තුළ වසරේ ඇතැම් කාලවකවානුවල එළවළු මිල ඉහළ යාමත් ඇතැම් කාලවකවානුවල එළවළු මිල අසාමාන්‍ය ලෙස පහළ යාමත් සිදුවේ. මේ අනුව මෙම වැඩ සටහන මගින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පිළිතුරු අදාළ අධ්‍යක්ෂවරයා වෙතින් නැවත විමසා ඇති බැවින් පිළිතුරු ලබාගෙන පසුව ඉදිරිපත් කරන බව. | නිවැරදි දත්ත කාලීනව ලබාගෙන අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ සේවයේ අධ්‍යක්ෂ විසින් තම රාජකාරී කාලයේදි ජාතික විද්‍යා පදනම මගින් 2014 වර්ෂයේදී ගෝවා වගාවේ දියමන්ති පිට සලබයා ජීව විද්‍යාත්මකව පාලනය කිරීම පිළිබඳ වූ ව්‍යාපෘතිය සඳහා රු. 3,215,340 ක ප්‍රතිපාදන ලබා ගෙන සිදු කරන ලද පර්යේෂණය 2020 නොවැම්බර් 10 දින වන විටද නිමකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පර්යේෂණ සැලැස්මක් සකස් කර ඒ අනුව පර්යේෂණ නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.5** **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 තුන්වන කන්නයේ මුං සහ කව්පි විශේෂ වගා වැඩසටහන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 220.258 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද එලෙස වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් රු.මිලියන 100.84 ක් කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ 2020 අගෝස්තු 12 වන දින ලිපිය ප්‍රකාරව අවුරා තබා තිබුණි. ඒ සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද හෙක්ටයාර 15734 ක් හා 2500 ක් වගා කිරීම වෙනුවෙන් රු. මිලියන 80.81 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, නියමිත ඉලක්කය සපුරා නොගැනීම මත ප්‍රතිපාදනයෙන් රු.මිලියන 52.77 ක් උපයෝජනය කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | ප්‍රතිපාදන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |

**3.6** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද 2020 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ අනුකූලතා වාර්තාවට අනුව 2.9, 8.4 හා 9.1 යන කරුණු අනුකූල වන බවට දක්වා තිබුණද එම කරුණු අනුකූල වී නොතිබුණි. | හානි පාඩු ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව සමීක්ෂණ කටයුතු සිදු කිරීමේ ප්‍රමාදයක් තිබුණද, භාණ්ඩ වෙන්දේසි එකවර පවත්වා 2020 අගෝස්තු 31 දිනට පෙර නිම කර ඇති බව හා 2021 අගෝස්තු 31 දිනට පෙර අපහරණ ක්‍රියාවලිය සිදු කිරීමට මේ වන විට සැලැසුම් කර ඇති බව. | තොරතුරු වඩාත් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවට අනුව නියැදි පරීක්ෂාව සඳහා තෝරා ගනු ලැබූ සමාජ ආර්ථික හා සැලැසුම් අංශයේ කාර්යසාධන දර්ශක පිළිබඳ පරීක්ෂා කිරීමේදී දර්ශක 06 ක් හඳුනාගෙන තිබුණි. එම සියලු දර්ශකවල කාර්යසාධනය සියයට 50 ඉක්මවන බව දක්වා තිබුණි. එසේ වුවද එම දර්ශක සකස් කිරීමට පදනම් කරගෙන තිබූ තාක්ෂණික ක්‍රියාකාරී සැලැස්මේ වාර්තා ඒකකයට අදාළ ක්‍රියාකාරකම් 18 කින් ක්‍රියාකාරකම් 09 ක් එනම් සියයට 50 ක ට අඩු කාර්යසාධන මට්ටමක් ළඟා කරගෙන තිබුණි. | Covid- 19 වසංගත තත්වය හමුවේ රට තුල සංචරණ සීමා පැවතීම නිසා සමීක්ෂණ කටයුතු කිරීමට නොහැකිවීම හා නිවසේ සිට අධ්‍යනය කිරීමට සිදු විය. මෙම තත්වය නිසා 2020 වර්ෂයේ දී අපේක්ෂිත ප්‍රගතිය 2020 වර්ෂයේ දී තාක්ෂණික ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ප්‍රතිශතයට වඩා අඩු වී ඇති බව. | සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.7 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදනයන් 4 කට අදාළ මිලදී ගැනීම් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2(අ) හා (ආ) මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලද වකවානුව තුළ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන්, නිලධාරීන්ගේ පැමිණීමද විධිමත් ලෙස සිදු නොවූ හේතුවෙන් එවැනි කාලසටහනකට අනුව විධිමත්ව කටයුතු කිරීමට නොහැකි වී ඇති අතර, මේ සම්බන්ධයෙන් මා විසින් අධ්‍යක්ෂවරයා වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ)**ii** මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගැයීම් කමිටුව මඟින් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදනයන් 2 කට අදාළව පිරිවිතර සමාලෝචනයක් සහ අනුමත කිරීමක් සිදුකර නොතිබුණි. | මෙම ප්‍රමාද දෝෂයන් හා මගහැරීයාම් ඉදිරියේ දී ඇති නොවීමට වග බලා ගන්නා මෙන් අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | එනජයිසර් (විදුලි වැට) මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යය සඳහා ඒකකයක් රු. 23,500 බැගින් වන සේ ඒකක 851 ක් සඳහා පිරිවැය රු. 19,998,500 ක් වන ලෙස ඇස්තමේන්තු 2020 ජුලි 21 දින අනුමත කර තිබුණද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.3.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙළ කිරීම, 4.3.3. මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම, 2.6.1(අ) ii මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර සමාලෝචනය කිරීම, 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණය ලබා ගැනීම යනාදිය සිදුකර නොතිබුණි.මුං වගාව ස්ථාපනයෙන් පසුව භෝග වගාව ආරක්ෂා කිරීමේ අරමුණින් යුතුව විදුලි වැට මිලදීගෙන තිබුණද අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. තවද මීට අදාළව ගොවි සමිති පිහිටුවීමද සිදුකර නොතිබුණි. මෙලෙස මිලදීගත් විදුලි වැටවල් නියමිත දිනයට ගොවීන් වෙත ලබා දීමට නොහැකිව වටිනාකම රු. 3,138,750 ක් විදුලි වැට 155 ක් 2020 නොවැම්බර් 17 දින වන විට ගබඩාවල පැවතුණි. | විදුලි වැට අවශ්‍යම කාල සීමාවේදී එනම් අගෝස්තු මස අග සතියේ දිස්ත්‍රික්ක වෙත ලබා දී ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර මිලදීගත් භාණ්ඩ ගොවීන් වෙත අවශ්‍ය කාලසීමාවේදී ලබා දීමටත් ප්‍රදේශීය ආයතන විසින් ගොවීන් වෙත නියමිත පරිදි ලබා දීම පිළිබඳවත් පසු විපරමක් සිදු කළ යුතු වීම. |
| (ඈ) | පේරාදෙණිය, සරසවි මාවත, අංක 2/11 රජයේ නිවාසය අලුත්වැඩියා කිරීම සඳහා වූ ඇස්තමේන්තුවේ අයිතම අංක 37 අනුව ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූලව ඇස්බැස්ටෝස් ගෙනවිත් සවිකිරීම සහ එහි එමල්ෂන් තීන්ත දෙවරක් ආලේප කිරීම වර්ග මීටර් 229.07 සඳහා රු.229,070 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද එමල්ෂන් තීන්ත දෙවරක් ආලේප කර නොතිබුණි. ඒ අනුව රු. 75,135 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි. තවද වැහි පීහිලිවල 2' -0' පරතරයට පීහිලි ආධාරක ( Gutter brackets ) යෙදීම සිදු කර නොතිබීම, කොරිඩෝවේ විවෘත ප්‍රදේශ සඳහා Gage 10 GI කොටු දැලක් වෙනුවට Gage 12 GI කොටු දැලක්යෙදීම, මුළුතැන්ගෙයි ටයිල් කැට බොල් වී තිබීම හා සිවිලිමට බිඩින් පටි යොදා නොතිබුණද එම අයිතමයන් සඳහා එකතුව රු.340,945 ක මුදලක් ගෙවා තිබුණි. | රඳවුම් කාලසීමාව තුළ අඩුපාඩු සකස් කර ගැනීමට කටයුතු කරනු ලබන බවත් එසේ නොමැති නම් රඳවුම් මුදල් යොදාගෙන සිදු කිරීමට කටයුතු කරන බව. | කොන්ත්‍රාත් කාර්යයන් නිසිපරිදි අධීක්ෂණය කළ යුතු වීම. |

## 3.8 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ඉඩම් පිළිබඳ කාර්යය සංග්‍රහයේ 224 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් මැනීම් සිදු කර විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන 10 කට අදාළ හෙක්ටයාර 3901.82 ක් වූ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2943.07 ක් පවරාගෙන නොතිබුණි. | ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා දැනටමත් ක්‍රියාකර ඇති බවත් මෙම පවරා ගැනීම් ක්‍රියාවලිය වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ දෙකක් යටතේ වූ එක් එක් දිස්ත්‍රික්ක යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන මඟින් සිදුකර ගැනීමට සිදුව තිබීමත්, දිවයිනේ පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුකොට ගෙන මෙම පවරා ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් සිදුවී ඇති බව. | දෙපාර්තමේන්තුව භුක්ති විඳින සියළුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශාක නිරෝධායන ඒකකය වෙත 2019 ඔක්තෝබර් 29 වන දින යම්කිසි සතෙකුට හෝ මාධ්‍යයකට වර්ධනය වීම සඳහා අවශ්‍ය ප්‍රශස්ත උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පවත්වා ගෙන යාම යන කාර්යයන් ඉටුකිරීමේ අරමුණින් මිලදී ගන්නා ලද වටිනාකම රු. 3,594,672 ක් වූ ඉන්කියුබේටර් උපකරණය විගණන දින වූ 2020 නොවැම්බර් 10 දින වන විටත් තෙකලා විදුලිය ලබා නොගැනීම හේතුවෙන් මාස 11 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නැත | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |
| (ඇ) | පේරාදෙණිය, සරසවි මාවත, අංක 2/11 රජයේ නිවාසය රු.1,850,614 ක මුදලක් වැය කරමින් අලුත්වැඩියා කටයුතු 2020 ජනවාරි 8 දින අවසන් කර දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණද එදින සිට එම නිවාසය නිෂ්කාර්යව පැවතුණි. | මෙම නිවස අළුත්වැඩියා කර 2020 ජනවාරි 08 දින නිවසේ හිමිකරු විසින් භාරගෙන ඇත. වැඩ බිමේ ගලවා ඉවත් කර භාවිතයට ගත හැකි ද්‍රව්‍ය විධිමත් පරිදි භාර ගන්නා ලෙස හිමිකරු දැනුවත් කර නාස්ති වී යාම වලක්වා ගැනීමට එම නිවස තුලම ගබඩා කර ඇති බව. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |
| (ඈ) | බටඅත ගොවිපළෙහි නිෂ්පාදනය කරනු ලබන බීජ වී ගබඩා කිරීම සඳහා රු. 11,371,010 ක පිරිවැයක් දරා 2018 වර්ෂයේ ගබඩාවක් ඉදි කර තිබුණද එහි ඇස්තමේන්තු වටිනාකම රු.1,891,888 ක් වූ කාර්යාල කොටස 2020 සැප්තැම්බර් 04 දින වන විටද නිෂ්කාර්යව පැවතුණි. | ගබඩාව හා බීජ සැකසුම් ඒකකයට අයත් කාර්යාල කොටස කමත් ආදියේ වියළිම් ඇතුළු පූර්ව සැකසීමේ කටයුතු අධීක්ෂණය කරන නිලධාරියෙකු / නිලධාරිනියකගේ අවශ්‍යතාවය සඳහා ඉදිකර ඇති බවත් අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | බටඅත ගොවිපළෙහි වගා කටයුතු සඳහා භාවිතා කළ වටිනාකම රු.4,911,478 ක් වූ ට්‍රැක්ටර් රථ 10 ක්, වටිනාකම රු.550,000 ක් වූ අත් ට්‍රැක්ටර් 4 ක් සහ වටිනාකම රු.80,000 ක් වූ යතුරුපැදි 4 ක් හා ආයතන 5 කට අදාළ වාහන 15 ක් නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි. | අපහරණය සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බව | ආයතනය සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු අතර භාවිතයට ගත නොහැකි සම්පත් විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | තරුණ ගොවි සමාජ මූලස්ථානය මගින් 2009 වර්ෂයේ ලංකා බැංකුවේ තැන්පත් කරන ලද හා 2008 වර්ෂයේ මහජන බැංකුවේ තැන්පත් කරන ලද ස්ථාවර තැන්පතුවල වටිනාකම 2019 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙළින් රු.1,212,500 ක් සහ රු. 1,027,271 ක් විය. අදාළ ස්ථාවර තැන්පතු මුදල් ප්‍රයෝජනවත් කටයුත්තක යෙදවීම කෙරෙහි 2016 වර්ෂයේ ජාතික සමුළුවේ දී අවධානය යොමු කළද 2020 දෙසැම්බර් 31 දින වන විටද අදාළ මුදල් ඌන උපයෝජිතව පැවතුණි. | 2017 දෙසැම්බර් 11 දින පැවති තරුණ ගොවි සමාජ ජාතික බල මණ්ඩල රැස්වීමේදී එම කරුණු සාකච්ඡා කර ඇතිමුත් අවසන් නිගමනයකට එළඹ නොමැති බවත්, මේ පිළිබඳව ඉදිරියේදී අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට එම අරමුදල ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යෙදවීමට කටයුතු කරන බව. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |
| (උ) | ආයතන 02 කට අදාළව රජයේ නිවාස 10 කට අයත් හෙක්ටයාර් 4.2603 ක භූමි ප්‍රමාණයක්, බිබිල උද්‍යාන භෝග පුහුණු සහ සංවර්ධන ආයතනයට අයත් හෙක්ටයාර් 0.0252 ක් හා අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය) කාර්යාලයට අයත් සංචාරක බංගලා පර්චස් 02 ක භූමි ප්‍රමාණයද අනවසර අල්ලා ගැනීම් සිදු කර තිබුණි. | අනවසරකරුවන් ඉවත්කර අදාල ඉඩම් මෙම දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | අනවසර අල්ලා ගැනීම් සම්බන්ධව නීතිමය පියවර ගත යුතු වීම |

## 3.9 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 සහ 881(1), කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 11 දිනැති දෙපාර්තමේන්තු නියෝග අංක 17/2015 සහ 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව ආයතන 06 ක ඇප තැබිය යුතු නිලධාරීන් 83 දෙනෙකු විසින් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | ඇප මුදල් තැබිය යුතු නිලධාරීන් ඇප මුදල් තැන්පත් කිරීමේ කටයුතු මේ වන විට සිදු කර ඇති බව. | මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව අදාළ නිලධාරීන් විසින් ඇප මුදල් තැබිය යුතු වීම. |

## 3.10 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මූල්‍ය ප්‍රකාශන සටහන 01 හි සඳහන් පරිදි තව දුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත් හැරීමට ඇති හානි හා පාඩු සම්බන්ධයෙන් සිද්ධි 390 කට අදාළව වටිනාකම රු. 320,279,512 ක් වූ පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර නොතිබුණි. | හානි හා පාඩු සම්බන්ධයෙන් වසර 10 ට වැඩි සිද්ධි සම්බන්ධයෙන් වූ මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ කටයුතු මේ වන විට අවසන් කර ඇති නමුත්, අධිභාර මුදල් අයකර ගැනීමේදී පැන නගින ගැටළු (උදා:- විශ්‍රාම වැටුපෙන් අයකිරීමේ ගැටළු, නීතිමය ගැටළු, වගකිවයුත්තන් විසින් ඉදිරිපත් කරන පෙත්සම්, අභියාචනා ආදිය) හා බොහෝ කලක් ගතවී ඇති හා අදාළ සිදුවීම් සිදුවී බොහෝ කලකට පසුව සිද්ධීන් වාර්තා වීම යනාදි කරුණු හේතුවෙන් අලාභයන් සම්බන්ධව අවසන් තීරණ ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීමෙන් අදාල අලාභයන් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීම ප්‍රමාද වී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 104(4) අනුව පූර්ණ වාර්තාව අලාභ හානිය සිදු වූ දින සිට මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවද 2020 දෙසැම්බර් 31 දින වන විට සිද්ධි 226 ක් සම්බන්ධයෙන් තව දුරටත් කටයුතු කළ යුතුව පැවතුණි. | සිද්ධි 445 අතුරින් සිද්ධි 219 ක මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ කටයුතු අවසන් වී තිබූ අතර අයකරගැනීම්, පොතෙන් කපාහැරීම් සම්බන්ධ ඉදිරි කටයුතු සිදුවෙමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2020 යල කන්නයේ කරදියනාරු රජයේ බීජ නිෂ්පාදන ගොවිපළෙහි නිෂ්පාදිත වටිනාකම රු.5,404,000 ක් වූ රටකජු බීජ කිලෝග්‍රෑම් 15,420 ක ප්‍රමාණයක් විගණිත දිනය වූ 2020 දෙසැම්බර් 18 දින වන විට ප්‍රරෝහණය අවම වීම මත පාරිභෝගික ලෙස අලෙවි කිරීමට කටයුතු කර තිබුණි. | පැල්වෙහෙර ශීත ගබඩා ඉඩකඩ ප්‍රමාණවත් නොවූ බැවින් ද, රිකිල්ලගස්කඩ බීජ බෝංචි ගබඩා ඒකකයේ කි.ග්‍රෑ.34000 ට ආසන්න ප්‍රමාණයක් ගබඩා කිරීමට කටයුතු කර ඇති බව, අනෙකුත් අතිරේක ආහාර බෝගවලට සාපේක්ෂව රටකජු සෝයා වැනි තෙල් අධික බෝග ඉක්මනින් පැළවීමේ ප්‍රතිශතය අඩුවීමට හැකියාව ඇත. ඉදිරියේ දී ජාතික අවශ්‍යතාවය අනුව රටකජු බීජ විශාල ප්‍රමාණයක් බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය මඟින් මිල දී ගැනීම හා සැපයීම් සිදුකළ යුතුව ඇති බැවින් සුදුසු පරිදි ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීමට සැලැසුම් කර ඇති බව. | නිෂ්පාදනය කරනු ලබන බීජ ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.11 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | පතෝල, වම්බටු, කරවිල හා මෑ බෝගයන්ගේ ආනයනය දේශීය බීජ අවශ්‍යතාවයට සාපේක්ෂව සියයට 15 කට වඩා අඩු මට්ටමක පැවතියද අනෙකුත් බෝගයන්ගේ ආනයනය දේශීය බීජ අවශ්‍යතාවයට සාපේක්ෂව සියයට 31.3 සිට සියයට 96 දක්වා ඉහළ පරාසයක පැවතුණි. ආනයනික ප්‍රමාණයන් අවම කිරීමත්, ඒ සඳහා දරන පිරිවැය අවම කිරීමත්,දේශීයව ඒවා නිෂ්පාදනයට ගොවීන් දිරිමත් කිරීමත් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දායකත්වය තවදුරටත් ලබා දිය යුතුව තිබුණි. | ලංකාවේ දේශීය එළවළු බීජ අවශ්‍යතාව ක්‍රම කිහිපයකින් සපුරා ගනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පෞද්ගලික ආයතන, පෞද්ගලිකව ගොවීන් බීජ නිෂ්පාදනයේ නියැලෙන අතර ඊට අමතර වශයෙන් බීජ අවශ්‍යතාවයෙන් යම් ප්‍රතිශතයක් ආනයනය කරනු ලබන බව හා ආනයනික බීජ වලින් වැඩි ප්‍රතිශයක් ලංකාවේ දේශගුණික තත්ත්ව යටතේ බීජ නිෂ්පාදනය කළ නොහැකි ගෝවා, බීට්, | දේශීය බීජ නිෂ්පාදනය වර්ධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | නෝකෝල්, කැරට්, මාළුමිරිස් (HYW) වැනි උඩරට එළවළු නිෂ්පාදනයට අදාළ බිජ වර්ග බව. | |
| (ආ) | නිෂ්පාදන වියදම් සමීක්ෂණයේ වාර්තා සැකසීමට අදාළව ක්ෂේත්‍ර දත්ත පරිගණක ගත කිරීමේදී ඇතිවන කාල ප්‍රමාදයන් අවම කර දත්ත වඩාත් නිවැරදිව හා පහසුවෙන් ක්ෂේත්‍රයේ දීම ඇතුළත් කළ හැකි පරිදි මෘදුකාංගයක් ස්ථාපිත කිරීම කාලෝචිත වුවද 2020 ඔක්තෝබර් 23 දින වන විටත් මෙම ඒකකයේ කටයුතු සඳහා සුදුසු මෘදුකාංගයක් සකස් කර නොතිබුණි. | නිෂ්පාදන වියදම් සමීක්ෂණය සඳහා පරිගණක ගත ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ලබා ගැනිම 2021 වර්ෂයට අදාළ ව්‍යෘපෘති යෝජනාවන් කෘෂිකර්ම අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව. | මෘදුකාංගයක් හඳුන්වාදීම තුලින් වඩාත් නිවැරදි දත්ත කාලීනව ලබාගත හැකිවීම. |
| (ඇ) | පූර්ව දැනුම් දීම් වැඩසටහනට දත්ත සපයනු ලබන කෘෂිකර්ම උපදේශකවරුන්ට ඔවුන්ගේ නිශ්චිත රාජකාරී (Routing Work) සිදුකරන අතර තුර දින 15 න් 15 ට තම බලප්‍රදේශයේ වගා වපසරිය වෙනස්වීම් පිළිබඳ දත්ත වාර්තා කළ හැකිද යන්න හා එසේ වාර්තා කිරීමේදී ඇතිවන ප්‍රායෝගික ගැටළු මොනවාද යන්න පිළිබඳව පර්යේෂණයක් හෝ අධ්‍යනයක් සිදුකිරීමකින් තොරව මෙම වැඩසටහන ආරම්භ කර තිබුණි. | කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ඉදිරි රැස්වීම් සඳහා එක් බෝග වල වගා ප්‍රගතීන් ලබා ගැනීම සිදුකරයි. මෙම කෘෂිකර්ම උපදේශකවරුන්ගේ නිශ්චිත රාජකාරීන් (routing work) වේ. මෙහිදී ලබාගන්නා ලද දත්ත නිරන්තරව කෘෂිකර්ම කාර්යාලවල සිට දත්ත එකතු කරන නිළධාරීන් මගින් පද්ධතියට එක්කිරීම සිදුකරනු ලබන බවත් බෝග පුරෝකථන වැඩසටහන හා සම්බන්ධ පුහුණු කිරීම් හා දැනුවත් කිරීම් සෑම වසරකම සිදුවේ. මෙහිදී බෝගවල ඇති ගැටළු හඳුනාගෙන නිවැරදි කිරීම් සිදුකරනු ලබන බව. | මෙම වැඩසටහන ඵලදායීව භාවිතා කිරීමට පසුවිපරම් අඛණ්ඩව සිදු කළ යුතු වීම. |
| (ඈ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික පර්යේෂණ හා සැලැසුම් සිදු කරනු ලබන එකම ආයතනය වූ සමාජ ආර්ථික සැලැසුම් මධ්‍යස්ථානය මගින් ආරම්භ කර තිබූ එළවළු වගාව පිළිබඳ පූර්ව දැනුම් දීමේ වැඩ සටහන පූර්ව සැලසුමකින් හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කර තිබුණි. | අදහස් දක්වා නොමැත | වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මී මැසි සංවර්ධන ඒකකය විසින් පවත්වාගෙන යනු ලබන මී මැසි ජනපද සඳහා 2020 වර්ෂයේ මුල් කාලයේ ඇති වූ වෛරස් රෝගී තත්ත්වයක් හේතුවෙන් ජනපද 114 පමණ විනාශ වී තිබීම ඉදිරියේදී මී මැස්සන්ට අහේනි කාලය එළඹෙන බැවින් මෙම වෛරස් රෝගය තව දුරටත් ව්‍යාප්ත වීමේ අවධානමක් පවතින බවත් දක්වා තිබුණි. එබැවින් මෙම වෛරස් රෝගී තත්ත්වය පාලනය සඳහා පර්යේෂණයක් හෝ විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | ආයතනයේ ප්‍රධාන කාර්යභාරයක් වන බැවින් වඩාත් කාර්යක්ෂමව අදාළ ගැටළු කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |
| (ඊ) | මී මැසි පාලන ඒකකය විසින් පසුගිය වර්ෂ 05 ක කාල පරිච්ඡේදය තුළදී සිදු කරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී දෙපාර්තමේන්තු නිලධාරීන්, ගොවීන්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්, මී මැසි පාලන උපකරණ නිෂ්පාදනය කරන්නන් සහ පාසල් සිසුන් පුහුණු කිරීමේ ප්‍රගතිය ක්‍රමයෙන් අඩුවන තත්ත්වයක් පැවතුණි. | පුහුණු වැඩ සටහන් සංවිධානය ප්‍රධාන වශයෙන් ඉල්ලීම් මත සිදුවන අතර ඉහත ප්‍රගතිය වාර්ෂිකව වෙනස් වීම සිදුවිය හැක. නමුත් මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |
| (උ) | ගන්නෝරුව උද්‍යාන බෝග හා සංවර්ධන ආයතනය යටතේ පැවති එරමිණිගොල්ල රඹුටන් පර්යේෂණ ඒකකය 2014 වර්ෂයේදී පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය යටතට පත් කර තිබුණි. එදින සිට විගණිත දිනය වූ 2020 දෙසැම්බර් 10 දින වන විට කිසිදු පර්යේෂණ කටයුත්තක් සිදු කර නොතිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින අධිකරණ ක්‍රියාමාර්ගයන් හේතුකොටගෙන එම තනතුරට බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති බැවින්, දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ නිලධාරීන්ගේ සැලකිය යුතු හිගයක් පවතින බවත් මෙම තත්වය නිසා ප්‍රාදේශීයව පැවති පර්යේෂණ ගොවිපළවල් වෙත පර්යේෂණ සඳහා නිලධාරීන් යොමු කිරීමට අපහසු වී ඇත. මේ හේතුවෙන් මෙම ගොවිපලවල මව් ශාඛ සංරක්ෂණය හා පැළ නිෂ්පාදනය පමණක් දැනට සිදු කරනු ලබන බව. | පර්යේෂණ නිලධාරීන් කඩිනමින් බඳවාගෙන පර්යේෂණ කටයුතු සඳහා ප්‍රදේශීය පර්යේෂණ ආයතන ඵලදායීව යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |
| (ඌ) | තරුණ ගොවි සමාජ ව්‍යවස්ථා මාලාවේ 58 වන වගන්තිය ප්‍රකාරව තරුණ ගොවි සමාජ ජාතික මණ්ඩලය යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වතාවක් රැස්විය යුතු වුවද තරුණ ගොවි සමාජ ජාතික සමුළුව අවසන් වරට 2016 පෙබරවාරි 07 දින පවත්වා තිබූ අතර ඉන් පසුව 2020 දෙසම්බර් 31 දින වන විටද අදාළ සමුළුව පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | කෘෂිකාර්මික කටයුතු සඳහා තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීම වෙනුවෙන් මෙම කාර්යයන් විධිමත්ව සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (එ) | මහඉලුප්පල්ලම ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයාගේ පැමිණීමේ , පිටවීමේ හා නිවාඩු ලබා ගැනීමේ අක්‍රමිකතාවයන්, ඉදිරිවැඩ සටහන් ඉදිරිපත් නොකිරීම, අනුමැතියකින් තොරව කාර්යය ස්ථානයෙන් පිටව යාම, රාජකාරි කාලය ආවරණය නොකිරීම, යටත් සේවකයන්ට අවාරශීලි නොවන අන්දමට ආමන්ත්‍රණය කිරීම, යටත් සේවකයන් තම පෞද්ගලික කටයුතු සඳහා යොදා ගැනීම සහ තම සේවකයන් රාජකාරි කාලය තුළ උපකාරක පන්ති සඳහා යොදවා ගැනීම යන අක්‍රමිකතාවයන් සිදු කර තිබුණද ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | උපකාරක පන්ති පැවැත්වීමට නිලධාරීන් යොදවා ගැනීම සම්බන්ධව මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ පරිදි, මහඉලුප්පලම ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයාට තදින් අවවාද කිරීමක් සිදුකර ඇති බවත් අනෙකුත් කරුණු සම්පන්ධයෙන් අදහස් දක්වා නොමැති බව. | අදාළ නිලධාරීන් සම්බන්ධව විධිමත්ව විනය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | --------------------- | --------------------------------- | ---------- |
| (අ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හා එක් එක් අරමුණුවලට අදාළ දර්ශක පිහිටුවා තිබුණත් එක් එක් දර්ශකය මැන බැලීමට ප්‍රමාණවත් මිණුම් දණ්ඩක් හෝ ක්‍රම වේදයක් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබඳ අරමුණු හා දර්ශක සැකසීම ජාතික තිරසර සංවර්ධන සභාව වෙත පැවරී ඇති බවත් මේ වන තුරුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළ නිශ්චිත තිරසර සංවර්ධනය පිළිබඳ අරමුණු හා දර්ශක පිළිබඳ නිවැරදි තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබා දී නොමැති බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ඉටුකර වලට අදාල දර්ශකය මැන බැලීමට මිණුම් දණ්ඩක් හෝ ක්‍රම වේදයක් සකස් කරගත යුතු වීම. |
| (ආ) | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගන්නා ආකාරය, කාල රාමුව පිළිබඳව සැලැසුමක් සකස් කර ඒ අනුව අදාළ ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් එක් එක් වර්ෂය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීමට අදාළව සැලැසුම් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීමට අදාළ සැලැසුම් සකස් කිරීමට කටයුතු කරන බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීමට හැකිවන පරිදි සකස් කිරීම කළ යුතු වීම |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට සේවා අවශ්‍යතා සුදුසු අවස්ථාවේදී හඳුනා ගනිමින් අවශ්‍ය අවස්ථාවේ බඳවා ගැනීම් සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 2672 ක් පැවතුණි. | සියළුම තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ ඉදිරි කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |